# සමකාලීන සමාජයෙහි විශ්වවිද්‍යාලයීය මානව ශාස්ත්‍ර අධ්‍යයනයේ සංකල්පීය සහ නිර්මාණාත්මක ශක්‍යතා සහ භාවිතයේ ප්‍රතිවිරෝධතා

ආචාර්ය ටියුඩර් වීරසිංහ

පූර්ව සමාජ යුගයේ සිට වර්තමාන සමාජ යුගය දක්වා පරිණාමය වූ මානව වර්ගයා සිය සමාජ පරිණාමයේ දී මූලික සමාජ යුග ත්‍රිත්වයක් ඔස්සේ ගමන් කොට වර්තමාන උපරි සමාජ යුගය දක්වා අවතීර්ණ වී සිටී. එම සමාජ යුග ත්‍රිත්වය වන්නේ පූර්ව සමාජ යුගය, සමාජ යුගය සහ උපරි සමාජ යුගයයි. මානව වර්ගයාගේ චින්තනය ද ඊට අදාළ ව පරිණාමයට පත් වී ඇත. එනම් මිනිස් වර්ගයාගේ චින්තනයේ පරිණාමය මූලික යුග ත්‍රිත්වයකට බෙදා දැක්විය හැකිය. සාම්ප්‍රදායික සමාජය, නූතන සමාජය සහ පශ්චාත් කාර්මික සමාජය ලෙස ද මෙය හැඳින්විය හැකි අතර එය ම පූර්වනූතන, නූතන සහ පශ්චාත් නූතන සමාජ ලෙස හැඳින්වූව ද සංකල්පීය දෝෂයක් නොමැත. (Dugin 2009)

පූර්වනූතන සමාජයෙහි (සාම්ප්‍රදායික සමාජයෙහි) චින්තනයේ මූලික කේන්ද්‍රය වූයේ පුරාණෝක්තිවේදය වන අතර පූජනීයත්වය, පාරිශුද්ධත්වය එහි මූලික හර පද්ධතිය බවට පත් විය. ආගම ප්‍රධාන ආධ්‍යාත්මික භාවිතය විය. නූතන සමාජයෙහි චින්තනයේ මූලික කේන්ද්‍රය වූයේ දර්ශනවාදය වන අතර මිනිසා කේන්ද්‍රීයව මානවවාදය එහි මූලික හර පද්ධතිය බවට පත් විය. පශ්චාත්නූතන සමාජයෙහි චින්තනයේ කේන්ද්‍රය වූයේ ආභාෂී යථාර්ථවාදය වන අතර උපහාසය හරඹය එහි මූලික හර පද්ධතිය බවට පත් විය. මෙහිදී අපගේ මූලික අවධානයට ලක් විය යුත්තේ පූර්වනූතන සමාජයෙහි පූජනීයත්වය පුරාණෝක්තිය සමග ද නූතන සමාජයෙහි යථාර්ථය විද්‍යාව සහ බුද්ධිවාදය සමග ද පශ්චාත් නූතන සමාජයෙහි ආභාෂී යථාර්ථය හරඹය සහ උපහාසය සමග ද සම්බන්ධ බවත් සම්භාව්‍ය විශ්වවිද්‍යාල බිහි වීම සහ වර්ධනය නූතන සමාජයෙහි චින්තනය සමග අවියෝජනීය ව සම්බන්ධ වන බවත්ය.



මේ අනුව මානව චින්තනයේ සුසමාදර්ශීය පරිණාමයේ දෙවන අවධියේ දී සම්භාව්‍ය විශ්වවිද්‍යාලයීය ක්‍රියාකාරිත්වය ආරම්භ වන අතර එය මූලික වශයෙන් විද්‍යාවේ තර්කනය සහ ක්‍රමවේදයට අනුකූල ව යථාර්ථය අධ්‍යයනය කිරීමේ, ගවේෂණය කිරීමේ මාදිලිය ඔස්සේ සත්‍ය සෙවීම සිදු කළේය. එය මූලික වශයෙන් ස්වාභාවික විද්‍යා සහ සමාජ විද්‍යා වශයෙන් වෙන් වෙන් ව සිදු වුව ද එහි මූලික අරමුණ එකක් ම විය.

16 වන සියවසේ සිට 20 වන සියවස දක්වා නූතන යුගයේ සමාජ ක්‍රියාකාරිත්වය සහ විශේෂයෙන් ම විශ්වවිද්‍යාලවල බුද්ධිමය ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස මූලික දෘෂ්ටිවාද ත්‍රිත්වයක් බිහි වී වර්ධනය වී නූතනත්වයේ අවසාන භාගය වන විට එය ගෝලීය දෘෂ්ටිවාද ත්‍රිත්වයක් බවට පරිවර්තනය වී මානව වර්ගයාගේ සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික, අධ්‍යාපනික සහ ශික්ෂණමය පරිණාමය කෙරෙහි තීරණාත්මක බලපෑමක් සිදු කළේය (වීරසිංහ 2016). එම දෘෂ්ටිවාද ත්‍රිත්වය සිය සම්භවයේ පිළිවෙළට ලිබරල්වාදය, කොමියුනිස්ට්වාදය සහ ජාතිකවාදය වශයෙන් නම් කළ හැකි අතර එම දෘෂ්ටිවාද ත්‍රිත්වයේ බලපෑමට පමණක් නොව ඒවා පාදක සමකාලීන මිනිසාගේ බුද්ධිමය හා ආධ්‍යාත්මික හැඩ ගැසීම සිදු වූවා පමණක් නොව ඒව වර්තමාන විශ්වවිද්‍යලයීය ශික්ෂණ ක්ෂේත්‍ර, විශේෂයෙන් මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා ආදී ක්ෂේත්‍ර කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇති කරන බව අවධාරණය කළ යුතුය.

පසුගිය සියවසේ දී මේ ගෝලීය දෘෂ්ටිවාද ත්‍රිත්වය අතර ගෝලීය ආධිපත්‍යය සඳහා වූ අරගලය උත්සන්න වූ අතර දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් අනතුරුව ෆැසිස්ට්වාදී ස්-වරූපය ගත් ජාතිකවාදී දෘෂ්ටිවාදය පරාජයට පත් විය. 20වන සියවසේ දෙවන අර්ධය තුළ කොමියුනිස්ට්වාදී දෘෂ්ටිවාදය මාක්ස්වාදී ස්වරූපයෙන් ද ලිබරල්වාදී දෘෂ්ටිවාදය බටහිරවාදී ස්වරූපයෙන් ද ගෝලීය ආධිපත්‍යය සඳහා වූ අරගලයෙන් 20වන සියවසේ අවසාන දශකයේ දී ලෝක කොමියුනිස්ට්වාදය පරාජයට පත් ව ලිබරල්වාදය ගෝලීය වශයෙන් විජයග්‍රහණය කළේය.

මෙහි අර්ථය වන්නේ මානව පරිණාමයේ නූතනත්වයෙහි වූ මානව සමාජ පරිණාමය පිළිබඳ ව වූ ප්‍රධාන දෘෂ්ටිවාද ත්‍රිත්වයෙන් ලිබරල්වාදය විජයග්‍රහණය කරමින් මානව වර්ගයාගේ නූතනත්වයේ ප්‍රධාන සහ එක ම ප්‍රකාශකයා බවට ලිබරල්වාදය පත් වීමය. පසුගිය දශක දෙක හමාරක කාලය යනු මානව සංහතියේ පරිණාමයේ ලිබරල්වාදී ආධිපත්‍යයේ කාල

පරිච්ඡේදයයි. මෙය ඇමරිකානු දෘෂ්ටිවාදියෙකු වූ ෆ්‍රැන්සිස් ෆුකෝයාම දුටුවේ ඉතිහාසයේ අවසානය සහ අවසාන මිනිසා ලෙසය. (Fucoyama 1991). නමුත් ඒ ඔහුගේ ආස්ථන මූලික ලෙසට අවිද්‍යාත්මක සහ පදනම් විරහිත බව පෙන්වා දිය යුතු අතර ඉතිහාසය නිමාවට පත් නොවූ අතර ලිබරල්වාදය මානව සමාජ පරිණාමයේ සහ මානව සමාජ පැවැත්මේ මාදිලියක් ලෙස සිය ඉතිහාසයෙහි ගැඹුරු වූ ද පුළුල් වූ ද අර්බුදයකට පත් වී ඇති බව අවධාරණය කළ යුතුය.

මෙම ලිබරල්වාදයේ ගෝලීය අර්බුදයට මානව ක්‍රියාකාරී ක්ෂේත්‍රයෙහි හසු නොවන ක්ෂේත්‍රයක් නොමැත. ඒ අතර සමකාලීන ආර්ථික, දේශපාලනය, සංස්කෘතිය, පරිසරය, ආධ්‍යාත්මය, අධ්‍යාපනය, ශික්ෂණය පමණක් නොව සමස්ත මානව සත්තාව ම අර්බුදයට ලක් වී අවසානය.

ගෝලීය අවකාශය තුළ විශ්වවිද්‍යාල පද්ධතියේ සහ එහි අධ්‍යාපනයේ පරිණාමය සම්භාව්‍ය, නිර්සම්භාව්‍ය සහ පශ්චාත්නිර්සම්භාව්‍ය වශයෙන් මූලික යුග තුනකට බෙදා දැක්විය හැකිය (Vasilkova 2008). මෙම බෙදීමට පාදක වී ඇත්තේ ඥානවිභාගී සම්ප්‍රදාය මත පදනම් වූ මූලික සබුද්ධිකවාදී ප්‍රභේද ත්‍රිත්වයකි. ඒ හෝ මේ දැනුමේ සමාජ සංස්කෘතිකත්වය, ඓතිහාසිකත්වය සහ වටිනාකම පිළිබඳ පරාමිතීන් හැඩ ගැසී ඇත්තේ අදාළ සබුද්ධිකවාදී ප්‍රවේශයේ සන්දර්භයේ ආකල්පයට අනුකූලවය.

සබුද්ධිකවාදයේ සම්භාව්‍ය ප්‍රභේදය නූතන යුගයෙහි විද්‍යාවේ ස්ථාපිත වීමත් සමග සිදුවිය. එහි දී විද්‍යාව සමාජයෙහි වරප්‍රසාදිත තත්ත්වයක් මෙන් ම සත්‍යයේ ඒකායන ආධිපත්‍යධාරියා බවට පත් විය. සත්‍යයේ විද්‍යාත්මකභාවය සහ පරාමිතීන් නිර්ණය කරන එක ම මාර්ගය වූයේ ආනුභවික සාධනය සහ තාර්කික ව සංවිධානාත්මක දැනුමයි. සම්භාව්‍ය අධ්‍යාපනයේ හරය අවබෝධ කර ගැනීමේ සම්භාව්‍ය පරමාදර්ශික සබුද්ධිකවාදයේ ක්‍රමවේදී මූලධර්ම සහ ප්‍රජානනයේ අනුස්ථාපනයන්ය.

අප කවුරුත් දන්නා ආකාරයට මුල් ම විශ්වවිද්‍යාල බිහි වූයේ මධ්‍යතන යුගයේ දී වන අතර ඒවා බිහි වීමට ප්‍රධාන සාධක දෙකක් බලපෑවේය. නගර සංවර්ධනය සහ ආගමික අධ්‍යාපන මධ්‍යස්ථාන බිඳ වැටීම එම ප්‍රධාන සාධක ද්වයයි (Girou, 2001). ප්‍රාරම්භක



වශයෙන් විශ්වවිද්‍යාල බිහි වන්නේ ආධ්‍යාත්මික සහ ප්‍රබුද්ධිමය සහයෝගිතාව පාදක කරගෙනය. එහි ආචාර්යවරු සහ ශිෂ්‍යයින් විශේෂ තත්ත්වයක් උසුලන ලදි. ඒ අනුව ශාස්ත්‍රාලීය ස්වාධීනත්වය බිහි විය. එකල ම විශ්වවිද්‍යාල යනු විශ්ව දැනුම නිර්මාණයේ ආයතන යන සං-කල්පය හැඩ ගැසුන බව ප්‍රකාශ කළ යුතුය. මධ්‍යතන යුගයේ විශ්වවිද්‍යාලවල ප්‍රබුද්ධ සමාශ්‍රය (සන්නිවේදනය) සිදුවූ මාදිලි ද්වය වූයේ Lectio සහ disputato එනම් දේශනය සහ විතර්කනයයි. නිදහස් සහයෝගිතාව දැනුම අත්පත් කර ගැනීම ප්‍රබුද්ධ සහවාසය, සාමූහික පර්යේෂණය හා ගවේෂණයේ පසුබිම රෝපණය වීම සහ ප්‍රවර්ධනය වීම සඳහා ප්‍රබුද්ධ සන්නිවේදනය සමාශ්‍රය ඉවහල් විය. සංස්කෘතියේ, සමාජයේ සක්‍රීය පෞරුෂයක් නිර්මාණයවීම අලුත් විශ්වවිද්‍යාල ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලය විය. නූතන යුගයේ අධ්‍යාපනය තේරුම් ගත් තවත් මූලධර්මයක් වූයේ පරමාදර්ශීය රූපකයකට අනුව ද්‍රව්‍යයේ රුවරූප සාධනයයි. 16 - 17 සියවස් වන විට එනම් නූතන විද්‍යා සුසමාදර්ශය තුළ දූනටමත් සබුද්ධිකවාදය ලෝකය ප්‍රජානනය කරගැනීමේ මාදිලියක් පමණක් නොව එය මානව පැවැත්මේ ම සත්තාවේ ම මාදිලියක් බවට පරිවර්තනය විය. මේ තත්ත්වය යුරෝපා සංස්කෘතිය සහ ලෝක දෘෂ්ටිවාදය තුළ ස්ථාවර වූ අතර, ක්‍රමානුකූල ව විද්‍යාව සහ තාක්ෂණය පුද්ගල සහ සමාජ සංවර්ධනයේ ප්‍රගතියේ පදනම බවට පත්විය. සබුද්ධිකවාදය තුළ විශ්වවිද්‍යාල සිය සක්‍රීය ස්වරූපය සහ සුජාතභාවය තහවුරු කර ගත්තේය. සමාජ යථාර්ථය නිර්වචනය කරන විද්‍යාත්මක ලෝක දෘෂ්ටිවාදය ව්‍යාප්ත කිරීමේ ප්‍රබල මෙහෙවර සම්භාව්‍ය විශ්වවිද්‍යාලවලට පැවරුණු අතර ක්‍රමානුකූල ව නූතනවාදී සම්භාව්‍ය විශ්වවිද්‍යාල යුරෝපා සමාජයෙහි ප්‍රබුද්ධ සංස්කෘතියෙහි කේන්ද්‍රීය ස්ථානයක් උසුලන්නට විය.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ නිර්සම්භාව්‍ය යුගය 20 වන සියවස ආරම්භයේ දී වර්ධනය වූ අතර එය සබුද්ධිකවාදී ප්‍රභේදයේ නිර්සම්භාව්‍ය ප්‍රවණතාව පාදක කොටගෙන ආරම්භ විය. විෂය-වේදික ප්‍රජානනයේ වේදකගේ නිරීක්ෂණාත්මක, බාහිර භූමිකාව සම්බන්ධ ව සැක පහළ වීමත් වාස්තවික සාධක අල්පීයකරණයවී ආත්මීය සාධක වර්ධනය වීම මෙහි විශේෂ ලක්ෂණයයි. එනම් මනෝවිද්‍යාත්මක සහ සමාජ-සංස්කෘතික සාධකවල බලපෑම කෙරෙහි විශේෂ අවධානය යොමු වන්නට විය. ෂත්‍යවාදී දූනුම ලබාගැනීම සඳහා විවිධ න්‍යායාත්මක සංකල්ප අතර සංවාදය පමණක් නොව විවිධ සබුද්ධිකවාදී ප්‍රභේද අතර ද සංවාදය අවශ්‍ය බව පෙන්වා දෙන ලදි. මෙය මෙතෙක් කල් මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍රය සඳහා විද්‍යාත්මක

ස්වරූපයක් ප්‍රදානය කිරීමෙහිලා සැලකිය යුතු බලපෑමක් සිදු කළේ ය. මේ නිර්සම්භාව්‍ය සබුද්ධිකත්වය සම්භාව්‍ය සබුද්ධිකත්වයේ තත්ත්වය, ප්‍රවණතාව, ගතිය වෙනස් කිරීමට තුඩු දුන්නේ ය. මේ ආකාරයට විශ්වවිද්‍යාලයීය මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා ක්ෂේත්‍රයෙහි විද්‍යාත්මක සුජාතභාවයට මේ නිර්සම්භාව්‍ය සබුද්ධිකත්වය ඉවහල් වූ බව ප්‍රකාශ කළ හැකි ය.

නිර්සම්භාව්‍ය විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ කැපී පෙනෙන වෙනසක් වූයේ දැනුම නිෂ්පාදනය කිරීමේ සිට දැනුම ප්‍රතිනිෂ්පාදනය කිරීම දක්වා මාරු වීමයි. එසේ ම විශ්වවිද්‍යාල ක්‍රමානුකූල ව සංහතිකකරණයට, ප්‍රජාතන්ත්‍රීකරණයට ප්‍රායෝගිකකරණයට සහ ජනප්‍රියකරණයට ලක් වන්නට වීම ද මේ අවධියේ දී දක්නට ලැබෙන කැපී පෙනෙන ලක්ෂණයකි. මේ ප්‍රවණතාවේ වඩාත් ම ඉස්මතුව ඇති ලක්ෂණයට බවට වර්තමානයේ පත්ව ඇත්තේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය වාණිජකරණයට ලක්වීමයි. පෙර වූ ''සත්‍ය සෙවීමේ'' කාර්යය ලාභ සෙවීමේ කාර්යය බවට පත්විය. විශ්වවිද්‍යාල අධ්‍යාපනය සංහතිකකරණය වීමේ ප්‍රවණතාව එක් අතකින් සිදුවන අතර, අනෙක් අතින් එය පුද්ගලකරණය වීමේ ප්‍රවණතාව ද වර්ධනය වන්නේ ය. අධ්‍යාපනය පුද්ගලකරණය වීමේ වඩාත් ම රැඩිකල් සහ තාර්කික මාදිලිය වන්නේ ස්වයං අධ්‍යාපනයයි.

විශ්වවිද්‍යාල අධ්‍යාපන පරිණාමයේ අවසාන අවධිය 20 වන සියවස අවසානයේ දී සහ 21 වන සියවස ආරම්භයේ දී සනිටුහන් වන්නේ ය. විශ්වවිද්‍යාල අධ්‍යාපනය සිය ඓතිහාසික පරිණාමයේ පශ්චාත් නිර්සම්භාව්‍ය අවධිය නියෝජනය කරන සබුද්ධිකත්ව යුගයට අවතීර්ණ වී ඇත. එනම් මානව සමාජ පරිණාම සමාජ අවධියේ සිට උපරිසමාජ අවධියට පරිවර්තනය වී තිබේ. වෙනස් වචනවලින් ප්‍රකාශ කරනවානම් මානව සමාජය සිය ඓතිහාසික පරිණාමයේ පශ්චාත් නූතන සමාජයක් දක්වා ගමන් කර ඇත. මෙය එක් අතකින් නූතන සමාජයෙහි වූ සමාජ, ආර්ථික, තාක්ෂණික, සංස්කෘතික ගතික හා ප්‍රවණතා යථාර්ථයක් බවට ද අනෙක් අතින් පෙර සමාජ අවධියේ නොවූ අලුත් ගති ලක්ෂණ, සංකීර්ණතා, ව්‍යූහ ගුණ පද්ධති ගොඩ නැගී සමාජ පරිණාමයේ නව මට්ටමක් නව තලයක් නිර්මාණය වීමක් ලෙස ද හඳුනාගත හැකි ය. සමස්ත සමාජ ජීවිතය විඥාපකරණය වීම, සංස්කෘතික සංකරණයවීම, ප්‍රත්‍යකකරණය වීම, බහු සංස්කෘතිකකරණයවීම, අභිසාරිකකරණයවීම, සංකේතකරණයවීම, ආභාෂීකරණයවීම, මෙම නව උපරිසමාජයේ හෝ පශ්චාත් නූතන සමාජයේ මූලික ලක්ෂණ වන්නේ ය. මෙම ගෙනහැර දක්වන ලද සත්තාත්මක ගති ලක්ෂණ නව සබුද්ධිකත්වයක් නිර්මාණය කිරීමට පාදක වී ඇති



අතර, එහි දී විෂය-වේදක අතර වෙනස්කම් නැති වී යන අතර තව දුරටත් ප්‍රජානන ක්‍රියාවලියේ, පර්යේෂණ ක්‍රියාවලියේ,  අරමුණ සත්‍ය සෙවීම නොව, එය නිර්මාණය කිරීමයි. පශ්චාත් නිර්සම්භාව්‍ය ඥාන විභාගය සාපේක්ෂතාවාදය සහ බහුත්වවාදය මත පදනම් වී ඇති අතර නිර්පේක්ෂ සත්‍ය සොයනවාට වඩා එකිනෙකට සමීප ව පිහිටා ඇති විවිධ දෘෂ්ටිකෝණවල සහ භාවිතයන්ගේ සමානත්වය ගොඩනගන්නට ප්‍රයත්න දරන්නේ ය. විද්‍යාත්මකභාවයේ නිර්ණායක බවට සමාජ සංස්කෘතික පරාමිතීන් පත් වන්නේ ය.

මේ තත්ත්වය තුළ විශ්වවිද්‍යාල ශාස්ත්‍රාලීය අධ්‍යාපනය පවතින සංස්කෘතික තත්ත්වය සමග ප්‍රතිවිරෝධී වන්නේ ය. විශ්වවිද්‍යාල අධ්‍යාපනය, විශේෂයෙන් මානවවාදී අධ්‍යාපනය සෑමදාකම වාගේ යොමු වී තිබුණේ මිනිසා සම්බන්ධ ගැටලු විසඳීම සඳහා බව සදහන් කළ යුතුය. අධ්‍යාපනය, ශික්ෂණය, ආලෝකනය, පුනරුදය, ආදී සියලු සංකල්ප වල  මූලික හරය පදනම් වී තිබුණේ මානව ශාස්ත්‍ර විද්‍යාවන් තුළය.

වර්තමාන විශ්වවිද්‍යාලයීය මානව ශාස්ත්‍ර අධ්‍යාපනයේ හරය, එහි නිර්මාණාත්මක ශක්‍යතා සහ එහි න්‍යායික සංකල්පීය මට්ටම ගැඹුරු සහ පුළුල් අර්බුදයකට පමණක් නොව බිඳ වැටීමකට ලක් වී ඇති බව අපගේ අදහසයි. ගෝලීය ලිබරල්කරණයේ ප්‍රතිඵලයක් වශයෙන් මානව සත්තාව පශ්චාත් මානව සත්තාවක් බවට වී ඇති අතර සංක්‍රාන්තික මානවවාදය උපරි සමාජ තල අතර ඉතා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. මනුෂ්‍ය පැවැත්මම සිය සත්තාත්මක සහ ඓතිහාසික සීමා වලින් ඔබ්බට ගොස් ඇති අතර වර්තමානයේදී මානවශාස්ත්‍ර වෙනුවට පශ්චාත් මානවශාස්ත්‍ර ද, කලාව වෙනුවට පශ්චාත් කලාවද, සිනමාව වෙනුවට පශ්චාත් සිනමාවද සංගීතය වෙනුවට පශ්චාත් සංගීතයද, සංහතික සන්නිවේදනය වෙනුවට පශ්චාත් සංහතික සන්නිවේදනය ද සාහිත්‍ය, නර්තනය, නාට්‍ය, රංගනය, භාෂාව, චින්තනය, චර්යාව, හැසිරීම සහ නිර්මාණකරණය ආදී සියලු මානව ක්‍රියාකාරීත්වයේ තත්වයත් එහි පශ්චාත් තත්වයට ගමන් කර තිබේ.

මේ අනුව වර්තමානයේදී කලා නිර්මාණ බිහි කිරීමේදී න්‍යායික සංකල්පීය පදනම බිඳ වැටී ඇති අතර විශේෂයෙන් මානව සත්තාවේ දෘෂ්ටිවාදී, මානසිකත්ව, සෞන්දර්ය කලාත්මක පැතිකඩ එක් අතකින් උපරි සමාජ හෝ පශ්චාත් නූතන සමාජ සමාජ - ආර්ථික ගතික සහ වුවමනාවන් සමග ද අනෙක් අතින් සමකාලීන තාක්ෂණික සංඛ්‍යාංකකරණයට සහ

තාක්ෂණික අභිසාරිකරණයකට ලක්වීම හේතුකොට ගෙන කලා නිර්මාණ මානව සහ සමාජ යථාර්ථය ප්‍රතිනිර්මාණය කිරීමේ භූමිකාවෙන් ඉවත් ව ඇත. වර්තමානයේ මානව සංස්කෘතික කලා ක්ෂේත්‍රය සංඛ්‍යාංකකරණය වීමේ සහ ශ්‍රව්‍ය - දෘශ්‍යකරණය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් කලාව යථාර්ථයත් සමග, කලාව ජීවිතයත් සමග වූ සම්බන්ධතාවේ සෞන්දර්යාත්මක ශෛලිය, රූපකය ස්වරූපය අවසන් වන්නේ ය. සංඛ්‍යාංක කලා පඨිතයේ මූලික ම ඒකකය වන්නේ සංඛ්‍යාංකික සංශ්ලේෂී රූපක වන අතර එම සංඛ්‍යාංකික සංශ්ලේෂී රූපක පාදක කොටගෙන අනේකවිධ වූ ද, අසීමිත වූ ද, ''දේවල්'' නිෂ්පාදනය කළ හැකි ය. නමුත් ඒවාට කලා-සංස්කෘතික නිර්මාණ ලෙස හැඳින්විය හැකි ද යන්න ප්‍රශ්නයකි.

වර්තමාන විශ්වවිද්‍යාලයීය මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨවල මූලික කර්තව්‍යයක් වන්නේ සංස්කෘතික කලා නිර්මාණකරණය පිළිබඳ ව ප්‍රතිසංකල්පීයකරණයකට සහ ප්‍රතින්‍යායකරණයකට භාජනය කරමින් එය මානව සත්තාවේ සීමා තුළ ස්ථානගත කිරීමත් එම නව තාක්ෂණික සහ සමාජීය ශක්‍යතා මානව විෂය ගුණාත්මක ව වර්ධනය කිරීම සඳහා විවිධ මාර්ග ගවේෂණය කිරීමත් ය.


1. Dugin A (2009), Postphilosophy three paradigms in the history of thought, Moscow.
2. වීරසිංහ, ටී. (2016) සිව්මාන - ජාතික සහ ගෝලීය ප්‍රවණතා පිළිබඳ විචාරාත්මක පර්යාලෝක, තෝතැන්න ප්‍රකාශකයෝ, ආණමඩුව.
3. Fucoyama, F.(1991) The End of the history and last man, Newyork
4. Vasilkova, V.V. (2008) Classical University in unclassical Time, Tomsky University.
5. Girou, H.A. (2001) Theory and Resistance in Education, Westport CT. Bergin and Garvey.


# ABSTRACTS